**(හැඳින්වීම)**

අද ආගමන සමයේ දෙවන ඉරුදින වන අතර බයිබල් ඉරුදින යි. මෙදින ආගමන පහන් ටැඹේ දෙවන ඉටි පහන වන බෙත්ලෙහෙමේ ඉටිපහන දල්වමින්, ප්‍රේමයේ ආලෝකයෙන් අප ජීවිත නවතාවයකට පත්කර ගෙන කිතු උපතට සූදානම් වන්නට අප සැම කැඳවයි.

හිමිවන්නට යන මහිමාන්විත ප්‍රීතිය භුක්ති විඳිනු පිණිස අවංකකම නමැති සළුව පැළඳ සූදානම් වන්නට පළමු දේව ප්‍රකාශනයෙන් ද, ක්‍රිස්තුන් වහන්සේගේ ආගමනය සඳහා නිදොස්ව අවංකව සිටින්නට දෙවන දේව ප්‍රකාශනයෙන් ද අද දින අපට ආරාධනා කරනු ලබයි. ශුද්ධ වූ සුපුවත තුළින් ද ස්නාවක ජොහන් තුමාගේ දේශනය ගෙන හැර දක්වමින්, මනුෂ්‍ය දුර්වලකම්වලින් මිදී, කිතු සමිදාණන් පිළිගන්නට අපට මග පෙන්වයි.

එබැවින් වැරදි ජීවිත මාර්ගවලින් හැරී මනස්ථාපනය වෙමින්, අප අතරට වඩින සමිදාණන්ව පිළිගන්නටත් උන්වහන්සේගේ ප්‍රේමයෙන් අප සිත් පුරවා ගන්නටත් අවැසි වරම් පතා, අප සැම මෙම ශුද්ධ වූ යාගයට බැතියෙන් සහභාගි වෙමු.

**(විශ්වාසිකයන්ගේ යැදුම්)**

පිළිතුර : ස්වාමිනි, අප කරන යාච්ඤා අසා වදාළ මැනව.

1. ආදර දෙවි පියාණනි, ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන පැමිණීමට අප නිරන්තරයෙන් සූදානම් කරන ශුද්ධෝත්තම පියතුමා ඇතුළු රදගුරු, පූජක සහ පැවිදි සැම හට ඒ සඳහා අවැසි ශුද්ධාත්ම වරම් සහ ක්‍රිස්තු ප්‍රේමයේ ආලෝකය නොමදව දානය කරන පිණිස,

2. ආදර දෙවි පියාණනී, තේජශ්‍රීයෙන් යළි වඩින කිතු තුමන් අභිමුව නොකැළැල්ව සහ නිදොස්ව සිටින පිණිස අපගේ වැරදි ජීවිත මාර්ගවලින් ආපසු හැරී එන්නටත්, ඔබවහන්සේට ප්‍රසන්න දේව දරුවන් වන්නටත් අප සැමට අවැසි වරම් දානය කරන පිණිස,

3. ආදර දෙවි පියාණනී, ජීවන අරගලය සහ ස්වභාවික විපත් නිසා පීඩිතව සහ අසරණව සිටින අප ලක්වැසි ජනතාවට අවැසි නිසි විසඳුම් සහ සහන ලබා දෙන්නට සියලු ජන නායකයන්ට අවැසි නිසි මග පෙන්වීම හා ස්ථාවරත්වය දානය කරන පිණිස,

4. ආදර දෙවි පියාණනී, දේව වචනයේ හරය තුළ දිවි ගෙවමින්, දේව වචනය තුළ තම දිවිය සහ අන් අයගේ ජීවිත ආලෝකමත් කරන්නට අප මීසම් සංඝයේ සැමට අවශ්‍ය ජ්වලිත බව සහ ශුද්ධාත්ම මෙහෙයවීම නිරතුරු දානය කරන පිණිස,